# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 25 දරන කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 20 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 25 දරන කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 20 වන දින]

එල්.ඩී.—ඕ. අයි.එන්.සී. 16/2006.

**කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කොට සහ ඉටු කොට ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2009 අංක 25 දරන කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොළොන්නාව තරුණ බෞද්ධ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් සහ අභිධානය යටතේ ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය, එයට ඇත්තේ ය. කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.

2—PL 003013 -2,750 (2008/06)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) වෙනත් ආගම් පිළිපැදීමට සහ ප්‍රගුණ කිරීමට අගතියක් නොවන ලෙස බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම ;

(ආ) බෞද්ධාගමිකයන් අතර සමගිය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සහ තරුණ පරම්පරාව දුරාචාර ක්‍රියාවලින් ගලවා ගැනීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ සහ අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීමේ, ඔවුන් සේවයේ නියුක්ත කරවීමේ සහ ඔවුන් සේවයෙන් නෙරපීමේ ද, සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා දේ සිදු කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය, සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය, මේ පනතේ ඇති වෙනත් විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, එම රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන ධුර දරන්නන් සහ වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත කළමනාකරණ කමිටුවක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ විධායක සභාවේ ධුර දරන්නන්ගෙන් සමන්විත විය යුතු අතර, සංස්ථාවේ රීතිවලට අනුකූලව නව කළමනාකරණ කමිටුව තෝරා පත් කර ගන්නා තුරු, ඔවුන් එකී ධුර දැරිය යුතු ය.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස් වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කළමනාකරණ කමිටුවේ සහ සංස්ථාවේ කාර්යයන් කරගෙන යාම සහ එහි කටයුතු පවත්වාගෙන යාමේ දී නිලධාරීන්, සේවකයන් සහ නියෝජිතයන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී එයට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. රීති.

(2) එකී රීති, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින් මතු භාර ගනු ලබන ත්‍යාග, පැවරීම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ප්‍රදාන කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු කීපයක, සංස්ථාවේ බැරට තැන්පත් කළ යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් දැරීම සඳහා අවශ්‍ය සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**8.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය සහ ගිණුම්.

(2) සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති සංගමයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය සහ සංගමය වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබිය හැකි චංචල හෝ නිශ්චල යම් දේපළක් අත් කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව, දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු වූ එම කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, එය කිසිදු සාධන පත්‍රයකට

නොතැබිය යුතු ය. තව ද එම අත්සන් යෙදීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

**12.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.